ජනාසාව (මළ දේහය) තබනු ලැබ පිරිමින් ඔවුන්ගේ කර මත එය උසුලාගෙන යන විට එය යහපත් නම් එය මෙසේ පවසනු ඇත. "මාව ඉක්මන් කරන්න

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්රකාශ කළ බව අබු සඊද් අල්-කුද්රි (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: "ජනාසාව (මළ දේහය) තබනු ලැබ පිරිමින් ඔවුන්ගේ කර මත එය උසුලාගෙන යන විට එය යහපත් නම් එය මෙසේ පවසනු ඇත. "මාව ඉක්මන් කරන්න" එය යහපත් නොවී නම්, එය මෙසේ පවසනු ඇත. "අහෝ විනාශය! ඔවුන් මෙය ගෙන යන්නේ කොයිබට ද?" මිනිසා හැර සෙසු සියලු දෑ එහි හඬට සවන් දෙනු ඇත. මිනිසා එයට සවන් දුන්නේ නම්, ඔහු කම්පනයට පත්වනු ඇත." [صحيح] [رواه البخاري]

"මළ දේහය ඇඳ මත තබනු ලැබ පසුව එය පිරිමින් ඔවුන්ගේ කර මත උසුලාගෙන යන විට එය යහපත් නම්, තමන් ඉදිරියේ ඇති ස්වර්ගය දකිනු වස් තමන්ව ඉක්මන් කරන මෙන් පවසන බවත්, එය යහපත් නොවී නම්, තමන් ඉදිරියේ ඇති දඬුවම දකින බැවින් පිළිකුල් සහගත මහා හඩින්, 'අහෝ විනාශය! තමන්ව රැගෙන යන්නේ කොයිබට ද?' යැයි විමසා සිටින බවත්, එය මිනිසා හැර සෙසු සියලු දෑ එහි හඬට සවන් දෙනු ඇත. මිනිසා එයට සවන් දුන්නේ නම්, එහි ඇති දැඩි හඬ හේතුවෙන් ඔහුව කම්පනයට පත් කරනු ඇත" යැයි නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ පැවසූහ.

http://sunnah.global/hadeeth/si/show/3554